පලාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - සබරගමුව

සතිය - 08

සැකසුම - උපුලී චතුරානි ධර්මසේන


මාවනැල්ල අධ්‍යාපන කලාපය

විෂය - චිත්‍ර

ශ්‍රේණිය - 6

ක්‍රියාකාරකම :- 6.1.1 **වෙසක් උත්සවය අශ්‍රිත කලා අංග රසවිඳිමු.**

- වෙසක් දිනය ලෝකවාසී බෞද්ධ ජනතාවගෙගේ පූජනීය උතුම් වූ දිනයකි.
- 
- කුමරුගේ උත්පත්තිය, බුද්ධත්වය හා පිරිනිවන්පෑම යන තෙමඟුල සිහිගන්වමින් මෙම උත්සවය සිදු කරයි.





- බෞද්ධ පූජනීය ස්ථාන මුල් කරගෙන වෙසක් උත්සවය සිදුකරනු ලැබේ.
- වෙසක් උත්සවය හා බැඳි සංස්කෘතික අංග රැසකි.
- මේවා ආමිස සහ ප්‍රතිපත්ති පූජා වලින් සමන්විතයි. ආමිස පූජා යනු බුදුන් වහන්සේ වෙනුවෙන් කෙරෙන ද්‍රව්‍යමය වශයෙන් හා බාහිර අලංකරණයන් වේ. (තොරණ, බල්බ් වැල්, දන්සැල්, ශබ්ද පූජා, පහන් සැරසිලි ) ප්‍රතිපත්ති පූජා යනු බුදුන් වහන්සේගේ ධර්මය අනුව හැසිරීමයි. (භාවනා කිරීම්, බෝධි පූජා, පිරිත් ස්ඣායනය, සිල් ගැනීම)
- මෙහිදී සිදු කරන පින්කම් මඟින් මානව සහයෝගිතාව හා එක්සත්කම වැනි ආකල්ප වර්ධනය වේ.

- තොරණ, පහන් කූඩු, සුබ පැතුම් පත්, පහන් වැටි, පහන් සැරසිලි, බල්බ් වැල්, කොඩි ආදි විචිත්‍රවත් නිර්මාණ මෙන්ම බැතිමතුන් විසින් සිල් සමාදන්වීම, බෝධි පූජා, දන්සැල් හා ශබ්ද පූජා පැවැත්වීම මෙදින සිදු කරයි.
- වෙසක් නිර්මාණ කිරීමේදී ටිෂු කඩදාසි, ගොක් කොළ, වර්ණ කඩදාසි, ඉරටු, පොල් කටු, ආදි විවිධ ද්‍රව්‍යය භාවිත කරයි.
- පහන් සැරසිලි සඳහා කෙසෙල් ගස්, උණ බම්බු වලින් අලංකාර වැටි ද පහන් සඳහා විකල්ප ලෙස වෙල් කඳුරු ගෙඩි, නාවා ගෙඩි හා පැපොල් ගෙඩි භාවිත කරයි.
- මේ සියළු දේ විවිධ ජාතීන්ගේ නිර්මාණ රසඥතාව වර්ධනය කර ගැනීම සඳහා පාදක වේ.











<u>අභ්‍යාසය</u>

1) වෙසක් උත්සවය වැදගත් වන්නේ ඇයි?
2) වෙසක් උත්සවය විචිත්‍රවත් කරන සැරසිලි අංග තුනක් නම් කරන්න.
3) වෙසක් උත්සවයේදී බෞද්ධයන් අනුගමනය කරන පූජා විධි දෙක මොනවාද ?
4) වෙසක් උත්සවයේදී බෞද්ධයන් තුළ වර්ධනය වන ආකල්ප මොනවාද?
5) වෙසක් සුබ පැතුම් පතක් නිර්මාණය කර වර්ණ කරන්න.